ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ("ආයතනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 54(ඇ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.7,514,608 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධති අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 88 ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදයක් සඳහා වූ සියලුම ආදායම් හා වියදම් එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ඇතුළත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දුරකථන, ප්‍රවාහන සහ අනෙකුත් වියදම් එකතුව රු.7,406,651 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ලාභය වැඩියෙන් හා වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුහුණු පාඨමාලා ආදායම රු.729,781 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සියලු ආදායම් වියදම් මූල්‍ය ප්‍රතිඵලයට ඇතුළත් කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 ඡේදය ප්‍රකාරව තොගය, පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය ලබාගැනීමෙන් තොරව පිරිවැය වූ රු.16,739,068 ට තොගයේ වටිනාකම දක්වා තිබුණි.	තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් සලකා බලා අඩු අගයට දැක්වීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව තොගය අගය කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 50 හා 51 ඡේද ප්‍රකාරව භාවිතයට ගනු ලබන වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන පිරිවැය රු.709,173,336 ක් වූ වත්කම් සම්බන්ධව එසේ වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි.	ධාරණ අගය ශූන්‍ය වූ වත්කම් ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 77 ඡේදය ප්‍රකාරව රු.40,677,054 ක් වූ ප්‍රත්‍යාගණන ලාභය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හා අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශයේ වෙනම හෙළිදරව් කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	ප්‍රත්‍යාගණන ලාභය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව හෙළිදරව් කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි 16 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදු නොවුණු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගණුදෙණු වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

(උ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි 58 ඡේදය ප්‍රකාරව සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදීම මූල්‍ය වත්කම් හානිකරණයක් සිදුවී ඇත්ද යන්න පිළිබඳ තක්සේරු කර එසේ අඩු වී ඇත්නම් හානිකරණය අඩු කළ අගයට එම වත්කම් දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවතෙන රු.17,349,400 ක් වූ ණය ගැති ශේෂ 208 ක් සඳහා අපහායන පරීක්ෂාවක් සිදු කර ධාරණ අගය දැක්වීම වෙනුවට රු.173,494 ක අඩමාන ණය වෙන් කිරීමක් කර තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 ප්‍රකාරව සියලුම ණයගැතියන් විශ්ලේෂණය කොට විගණන කමිටු හා මහා මණ්ඩල අනුමැතිය ගෙන මෙම ණයගැතියන් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් හානිකරණය ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයුගණක ලාභ සහ අලාභ ගැලපුම් රඳවාගත් ඉපැයුම්වලට ගැලපිය යුතු වුවත් රු.19,526,749 ක් වූ ආයුගණක ලාභය අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනයේ වෙනත් සංචිත යටතේ දක්වා තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	ආයුගණක ලාභ සහ අලාභ ගැලපුම් රඳවාගත් ඉපැයුම්වලට ගැලපිය යුතුය.
(ආ)	රු.8,687,329 ක රසායනාගාර උපකරණවලට අදාළව රු.868,732 ක් වූ වර්ෂයේ ක්ෂය වියදම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාන අගයකින් වර්ෂයේ ලාභය හා වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම ක්ෂය ප්‍රමාණය 2025 ජනවාරි 27 දින නිවැරදි කර ඇත.	කාලපරිච්ඡේදයට අදාල ක්ෂය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	2022,2023 හා 2024 වර්ෂවල සේවයෙන් ඉවත්වූ සේවකයින් 04 දෙනෙක් වෙනුවෙන් නියමිත දින පාරිතෝෂික මුදල් නොගෙවීම හේතුවෙන් ගෙවිය යුතු වූ රු.319,953 ක අධිභාරය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් කර නොතිබුණි.	ඉදිරියේ දී පාරිතෝෂික නියමිත පරිදි සේවයෙන් ඉවත් වූ අය සඳහා ගෙවීමට කටයුතු කරනු ලැබේ.	හඳුනාගනු ලබන වගකීම් සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුය.

(ඇ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ලාභයෙන් අඩුකර දැක්විය යුතු රු.27,602,746 ක වර්ෂයේ පොලී ආදායම අඩුකර දක්වා නොතිබූ අතර මුදලින් ලද පොලී ආදායම වූ රු.150,106,994 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ලෙස දක්වා නොතිබුණි. ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාම් ලෙස පරිගණක මෘදුකාංග වර්ග 02 ක් සඳහා 2023 වර්ෂයේ ගෙවන ලද රු.11,657,928 ක් සහ 2014,2015 හා 2017 වර්ෂවලදී මාලඹේ ඉඩම මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.168,000,000 ක අත්තිකාරම් මුදල් සාවද්‍ය ලෙස දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	කාලපරිච්ඡේදය තුළ සිදුව ඇති මුදල් ප්‍රවාහයන් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැළපිය යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂ 2015 - 2021 අතර කාලසීමාවට අයත් රු.3,220,386 ක කොන්ත්‍රාත් රඳවා ගැනීම් තැන්පතු 22 ක් නිරවුල් කර ගැනීමෙන් තොරව තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.	ඉදිරියේදී මහා මණ්ඩල අනුමැතිය ලබා ගෙන ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.	නැවත නොඉල්ලන බවට තහවුරු කරගෙන තැන්පතු නිරවුල් කිරීමට පියවර ගත යුතුය.
(ආ)	2019 වර්ෂයේ සිට පවතින ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රු.49,747,362 ක් නිරවුල් කිරීමකින් තොරව තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.	මෙම NBT මුදල් ප්‍රමාණය පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් විමසීමක් කලද ලිඛිතව කිසිඳු පිළිතුරක් නොලද හෙයින් ඉදිරියේදී මහා මණ්ඩල අනුමැතිය මත මෙම මුදල ගිණුම් වලට ගැලපීමට පියවර ගනු ලැබේ.	ගෙවිය යුතු බදු මුදල් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත			
	(i) 2(ඇ) වගන්තිය	SLS ලාංඡනය භාවිතය සඳහා බලපත්‍ර නිකුත් කළ විට නිරතුරුවම අදාල නිෂ්පාදිත ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වීම තහවුරු කිරීම වෙනුවෙන් තත්ත්ව පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර කොන්දේසිවලට අනුකූලවීම සත්‍යාපනය කිරීම සඳහා විවෘත වෙළඳපොලෙන් නිෂ්පාදිතයේ නියැදි ලබාගෙන පරීක්ෂාවන් සිදුකළ යුතුය. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රමිති සහතික ලාංඡනය (SLS) ලබාගෙන තිබූ භාණ්ඩ සංඛ්‍යාව 924 ක් වුවත් 2024 වර්ෂයේදී වෙළඳපොල සමීක්ෂණ සිදුකර තිබුණේ භාණ්ඩ වර්ග 183 ක් එනම් සියයට 20 ක් සඳහා පමණි.	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී වෙළඳපල නියැදි 183 ක් සහ වෙළඳපලට නිකුත් කිරීමට පෙර අපනයන පරීක්ෂණ සඳහා නියැදි 133 ක් ලබා ගෙන ඇත. ඒ අනුව SLS පසුවිපරම් පරීක්ෂණ කටයුතු සඳහා නියැදි 316 ක් ලබාගෙන පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. තවද අවශ්‍යවන සාම්පල ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමග ගිවිසුම් ගත වීමට අවශ්‍ය අවබෝධතා ගිවිසුම සකස් කර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අනුමැතිය සඳහා යොමු කර ඇත.	ප්‍රමිති ආයතන පනත ප්‍රකාරව නිෂ්පාදිත ප්‍රමිතියට අනුකූල බවට පසු විපරම් පරීක්ෂාවන් සිදු කළ යුතුය.
	(ii) 3(ඌ) වගන්තිය	ආයතනය පිහිටුවීමේ අරමුණක් ලෙස වෙළඳ ද්‍රව්‍ය, අමුද්‍රව්‍ය, නිෂ්පාදිත, නිෂ්පාදන සහ වෙනත් දේවල තත්ත්වය සහතික කිරීම සිදුකළ යුතු වුවද, ප්‍රමිති සහතිකය අනිවාර්ය කර ඇති භාණ්ඩවල වුවද, ගුණාත්මක තත්ත්වය තහවුරු	SLS ලාංඡන සහතික ක්‍රමය යටතේ, නිෂ්පාදන අනුකූලතාව සහ නිෂ්පාදන ක්‍රියාවලි අනුකූලතාව නිරන්තරයෙන්	පනත ප්‍රකාරව තත්ත්ව සහතික කිරීමට හා එම තත්ත්ව පවත්වා ගැනීමටත් අවශ්‍ය පාලන ක්‍රම ක්‍රියාත්මක

		කිරීමට හා නියාමනයටත්, ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූළ නොවූ නිෂ්පාදන පාරිභෝගිකයන් අතට පත්වීමට ඇති හැකියාව අවම කිරීමටත් අවශ්‍ය පාලන ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි.	අධීක්ෂණය කරනු ලැබේ. එමෙන්ම ඒ සඳහා කර්මාන්තශාලා තුල අඛණ්ඩ පසුවිපරම් විගණන සිදු කරනු ලබයි. එම විගණනවලදී SLS සහතිකයලත් භාණ්ඩය නිරතුරුව ප්‍රමිතියට අනුකූලව නිෂ්පාදනය කිරීමේ හැකියාව, ආයතනයේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය විගණනය කිරීම තුලින් තහවුරු කරගනු ලැබේ. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් ලබාගත් නියැදි ප්‍රමාණය 1963 කි. තවදුරටත්, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා, අහඹු ලෙස වෙළඳපල නියැදි ලබාගෙන පරීක්ෂා කරනු ලැබේ.	කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත	2022 හා 2023 වර්ෂවල සේවයෙන් ඉවත් වූ සේවකයින් 04 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.760,830 ක පාරිතෝෂික විගණිත දිනය වූ 2025 මැයි 31 දක්වාම ගෙවා නොතිබුණි.	පාරිතෝෂික ගෙවීම් නොකිරීමට මූලික වශයෙන් ඔවුන්ගෙන් ආයතනයට අය විය යුතු අය වීම් නොලැබීම බලපා ඇත. මේ අනුව ඉදිරියේදී කෙසේ හෝ අයවීම් අයකර ගෙන පාරිතෝෂික ගෙවීම් සිදු කරනු ඇත.	පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට කටයුතු කළ යුතුය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මුදල් රෙගුලාසි 395 (ඉ)	එක් ජංගම ගිණුමකට අදාලව 2024 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පැවති හඳුනා නොගත් තැන්පතු රු.34,708,751 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම හඳුනානොගත් තැන්පත් වලින් යම් ප්‍රමාණයක් 2025 ඉදිරි මාසවල දී හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.	හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) වගන්තිය	2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2025 වර්ෂයේ මැයි මස 29, 30 දෙදින සිදුකිරීමට නියමිතව ඇත.	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අදාල වර්ෂයේ ජුනි 15 ට පෙර විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතුය.
(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද මෙහෙයුම් අත්පොත			
(i) 4.2 ඡේදය	2024 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.	2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පවත්වා ඇත.	එක් වර්ෂයක් සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් අවම වශයෙන් 04 ක් පැවැත්විය යුතුය.

	(ii) 6.6 ඡේදය	2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ.	ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් 23 දිනැති අංක PED/03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදය	2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති නමුත්, ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා නොමැති ආයතන ලාභදායිත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය වෙත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා හිමිකම් නොලබයි. එසේ වුවද, ඒ අනුව කටයුතු නොකර ආයතනය විසින් 2023 ප්‍රසාද දීමනා ලෙස සේවකයන්ට රු.7,995,025 ක් ගෙවා තිබුණි.	මෙම 30% ඒකාබද්ධ අරමුදලට ගෙවීම Installment 4කින් ගෙවීමට මහා මණ්ඩලයේ අවසර ගෙන ප්‍රසාද මුදල් ගෙවීම සිදු කර ඇති අතර එම ආකාරයට මහා භාණ්ඩාගාරයට ඉදිරියේදී ගෙවීමට කටයුතු සිදු කරනු ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව නියමිත වර්ෂයේ ලාභයෙන් නියමිත ප්‍රේෂණයන් භාණ්ඩාගාරයට සිදු කර දිරි දීමනා සඳහා වන හිමිකම ලබා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.488,058,950 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.445,059,698 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.42,999,252 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ආදායම රු.154,464,151 කින් වැඩිවී තිබීමත් මුළු මෙහෙයුම් වියදම රු.40,206,320 කින් අඩු වීම හා මහා භාණ්ඩාගාර දායකත්වය රු.75,692,650 කින් වැඩි වී තිබීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනය විසින් 2020 වර්ෂයේ රු2,800,000 ක් වැයකර තොග පාලනය සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, ආරම්භක තොග ශේෂ පද්ධතියට ඇතුළත් නොකිරීම මත ස්ථාපිත කළ පරිගණක පද්ධතිය අපේක්ෂිත පරිදි නිවැරදිව තොග පාලනයට භාවිතා කළ නොහැකිව තිබුණි.	ඉදිරියේදී මෙම තත්වය වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	තොග පද්ධතිය අවශ්‍ය දත්ත සහිතව යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.

(ආ)	Local Area Network හා IP PBX System ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත අවස්ථා 02 කදී ගෙවන ලද රු.57,596,886 ට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(ආ) වගන්තිය ප්‍රකාරව ලබාගෙන තිබූ කාර්යසාධන සුරක්ෂණයන්හි වගකීම් කාලය ආවරණය වන පරිදි කාලය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	නියමිත ව්‍යාපෘති අවසන් නොකිරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් ලිඛිතව අවවාද ලිපියක් නිකුත් කර ඇති අතර කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කරගෙන ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ටින්මාළු නිෂ්පාදන ආයතන 03 ක් විසින් 2023 ජනවාරි 02 සිට සැප්තැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය තුළ ආනයනය කරන ලද ටින්මාළු තොග අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර තිබුණි. එහිදී සෑම ටින්මාළු තොගයකට නියැදි ලබා ගැනීම හා නිසි ප්‍රමිතියෙන් තොර බවට වන ලිපි නිකුත් කිරීම සඳහා දින 52 ත් 188 ත් අතර කාලයක් ගතවීම හේතුවෙන් නිසි ප්‍රමිතියට අනුකූල නොවූ තොග වෙළඳපොළට මුදා හැර තිබීමේ අවදානමක් පැවතුණි.	ටින් මාලු තොග සාම්පල පරීක්ෂාවේ දී අනුකූල නොවීම වාර්තා වූ අවස්ථාවල දී ටින් මාළු මාර්ගෝපදේශ සහ ප්‍රමිතිවලට අනුව දෝෂ සඳහා මූලික වර්ග කිරීම (initial sorting) සහ 100% වර්ග කිරීම සිදු කරයි. ඉන්පසු දෝෂ රහිත තොග පිළිබඳ අවසාන තීරණය ගැනීම සඳහා ක්ෂුද්‍රජීව පරීක්ෂණය සිදු කරයි. එම 100% sorting කළ යුතු අවස්ථාවල ඒ සඳහා ගතවන කාලය තොගයේ ප්‍රමාණය අනුව වෙනස් වේ. ප්‍රතිඵල ලබා ගැනීම සඳහා දින 14 - 15ක කාලයක් ගත වේ. එම පරීක්ෂණවල දී අනුකූල වීම් සිදු වූ අවස්ථා වල දී අනුකූලවීම් ලිපි සහ අනුකූල නොවීම සිදුවූ අවස්ථාවල දී ප්‍රතික්ෂේප ලිපි නිකුත් කරනු ලබයි. ඒ සඳහා සැලකිය යුතු කාල පරාසයක් ගත වේ.	ප්‍රමිති පිළිබඳ පරීක්ෂාවන් සිදු කිරීම කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල නොවූ තොග වෙළඳපොලට මුදා හැරීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.